සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

21980

ශ්‍රේණිය / தரம் / Grade: 10 ශ්‍රේණිය

# ඉතිහාසය - I

කාලය / நேரம் / Time: පැය 1 යි

නම / பெயர் / Name ..............................

විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

සැලකිය යුතුයි
- සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් ප්‍රශ්න සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.

## ඉතිහාසය I

01. ඉතිහාසය හැදෑරීමේ දී, භාවිතාවන මූලාශ්‍ර, බෙදෙන ප්‍රධාන කොටස් දෙක වන්නේ,
(1) සාහිත්‍ය හා නානක මූලාශ්‍ර ලෙසය.
(2) දේශීය හා විදේශීය මූලාශ්‍ර ලෙසය.
(3) සාහිත්‍ය හා පුරා විද්‍යාත්මක මූලාශ්‍ර ලෙසය.
(4) කාසි මූලාශ්‍ර හා නටඹුන් මූලාශ්‍ර ලෙසය.

02. අභිලේඛන මූලාශ්‍රයකට උදාහරණයක් නොවන්නේ මින් කවරක් ද?
(1) වල්ලිපුරම් රන් සන්නස.
(2) සීගිරි කුරුටු ගී.
(3) වංසත්ථප්පකාසිනිය.
(4) ඇම්බැක්කේ ලී කැටයම්.

03. ඇරිස්ටෝල් විසින් රචිත "ඩිමුන්ඩෝ" කෘතිය අයත් වන්නේ,
(1) ග්‍රීක මූලාශ්‍ර ගණයටය.
(2) රෝම මූලාශ්‍ර ගණයටය.
(3) චීන මූලාශ්‍ර ගණයටය.
(4) පෘතුගීසි මූලාශ්‍ර ගණයටය.

04. ශ්‍රී ලංකාවේ මධ්‍ය ශිලා යුගයට අයත් ජ්‍යාමික හැඩතලවලින් යුක්ත වූ ක්ෂුද්‍ර ශිලා මෙවලම් අයත් වන්නේ,
(1) පූර්ව ඓතිහාසික යුගයටය.
(2) මුල් ඓතිහාසික යුගයටය.
(3) ප්‍රාග් ඓතිහාසික යුගයටය.
(4) ශිෂ්ටාචාර යුගයටය.

05. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ පැරණිතම ලෙන ලෙස තොරතුරු රැසක් ලැබී ඇත්තේ,
(1) උඩමළල ලෙනෙනි.
(2) පාහියංගල ලෙනෙනි.
(3) බටදොඹ ලෙනෙනි.
(4) බෙල්ලන්බැඳි පැලැස්සෙනි.

06. මෙරට බිහි වූ පැරණිතම පුර නගර දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) පොළොන්නරුව හා දඹදෙණිය ය.
(2) අනුරාධපුරය හා සිරිපුරය ය.
(3) මාගම්පුරය හා සෙංකඩගලපුරය ය.
(4) අනුරාධපුරය හා මාගම්පුරය ය.

07. පැරණිතම සෙල්ලිපිවල සඳහන්වන පරිදි රාජ්‍ය ලේඛනාගාර ප්‍රධානියා හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
(1) කන පෙඩික ලෙසය.
(2) පන අදෙක ලෙසය.
(3) රූප අදෙක ලෙසය.
(4) බතගු ලෙසය.

■ නරඉසෙර හෙවත් නරේෂ්වර යන නමින් හඳුන්වා ඇත.
■ චක්‍රවර්ති සංකල්පයෙන් හඳුන්වා ඇත.
■ ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරයට නායකත්වය දී ඇත.

08. ඉහත සඳහන් රජවරුන් හා සම්බන්ධ සිදුවීම් පිළිවෙලින් ගැලපූ විට ලැබෙන නිවැරදි පිළිතුර තෝරන්න.
(1) නිශ්ශංක මල්ල රජු / කූටකණ්ණාභය රජු / දුටුගැමුණු රජු
(2) කූටකණ්ණාභය රජු / නිශ්ශංකමල්ල රජු / දුටුගැමුණු රජු
(3) කූටකණ්ණාභය රජු / දුටුගැමුණු රජු / නිශ්ශංකමල්ල රජු
(4) දුටුගැමුණු රජු / කූටකණ්ණාභය රජු / නිශ්ශංකමල්ල රජු

09. වසභ රජුගේ රාජ්‍ය පාලන සමයේ දී යාපනය හඳුන්වනු ලැබුයේ කුමන නමකින් ද?
(1) නකදිව් ලෙසය. (2) දඹකොල පටුන ලෙසය.
(3) එලිෆන්ට්පාස් ලෙසය. (4) නල්ලූර් ලෙසය.

10. ශ්‍රී ලංකාවේ පැරණි ගොවිතැන් ක්‍රම අතර ගොඩ ගොවිතැන හෙවත් හේන් වගාව පිළිබඳව සෙල්ලිපිවල සඳහන් වන්නේ,
(1) පිටදඩහස ලෙසය. (2) පිටිබිම් ලෙසය. (3) කටුසර ලෙසය. (4) ක්ෂේත්‍ර ලෙසය.

11. පහත සඳහන් සෙල්ලිපි හා සම්බන්ධ තොරතුරු නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර වන්නේ,

| | | |
|---|---|---|
| i.) | ගනේකන්ද විහාර සෙල්ලිපිය | A - දසගම් ඇත්තන් පිලබඳව සඳහන් වේ. |
| ii.) | කළුදිය පොකුණ සෙල්ලිපිය | B - දසමහ යෝධයන් පිළිබඳව සඳහන් වේ. |
| iii.) | සිතුල් පව්ව සෙල්ලිපිය | C - අවරණ හෙවත් "අමුණ" පිළිබඳ සඳහන් වේ. |
| iv.) | අභයගිරි විහාර සෙල්ලිපිය | D - දෙමළ බික්ෂූන් වහන්සේ කෙනෙකු ගැන සඳහන් වේ. |

(1) A B C D ය. (2) D B A C ය. (3) B D C A ය. (4) C A B D ය.

12. පහත සඳහන් මිනුම් ක්‍රම සම්බන්ධ තොරතුරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර වන්නේ,

| | | |
|---|---|---|
| i.) | දිග මැනීමේ කුඩාම ඒකකය | A - වියත |
| ii.) | අඟල් 9' ක දුරක් මැනීම | B - අමුණ |
| iii.) | වර්තමාන කිලෝමීටර 1 කට සමානය | C - ආංගුලය |
| iv.) | වර්තමාන අක්කර 2 කට සමානය | D - ගව්ව |
| | | E - පරමාණුව |

(1) E A D B ය. (2) D B A C ය. (3) B D C A ය. (4) C A B D ය.

13. පහත සඳහන් වෘත්තිකයන් සිටි ග්‍රාම නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
A - ගොවියන් B - ගොපල්ලන් C - ධීවරයින් D - වළං සාදන්නන්
(1) කසීකාර ගාම, ගෝපාල ගාම, කේවට්ට ගාම, කුම්භකාර ගාම
(2) ගෝපාල ගාම, කුම්භකාර ග්‍රාම, මණිකාර ගාම, වඩ්ඩකී ගාම
(3) කසීකාර ගාම, කුම්භකාර ග්‍රාම, කේවට්ට ගාම, වඩ්ඩකී ගාම
(4) මණිකාර ග්‍රාම, කුම්භකාර ග්‍රාම, කේවට්ට ගාම, වඩ්ඩකී ගාම

14. ගෘහපතීන් අතරින්ම ගමිකයකු තෝරාගත් බව බුද්ධඝෝෂ හිමියන් සඳහන් කරන්නේ,
(1) පූජාවලියේ ය. (2) සමන්තපාසදිකාවේ ය. (3) සද්ධර්මලංකාරයේ ය. (4) සද්ධර්මරත්නාවලියේ ය.

15. මෙරට පැරණි සමාජයේ යහ පැවැත්ම උදෙසා නීති භාවිත කල බවට සාක්ෂි රැසක් ඇති නමුත් ඒ හා සම්බන්ධ පහත කරුණු අතරින් එක් ප්‍රකාශයක් අසත්‍ය වේ. එම අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
(1) පළමු විජයබාහු රජුගේ නීති නිලධරියා වූයේ බුද්ධරාජ ය.
(2) නීති නිලධාරීන් හැඳින්වීමට "දණ්ඩනායක" යන නාමය භාවිත කර ඇත.
(3) අතීතයේ නීති සම්පාදනය කල ආයතනය හැඳින්වූයේ "නියමස්ථානය" යන පදයෙනි.
(4) පැරණි රජවරුන් විසින් කරවන ලද සෙල් ලිපිවල නීතිය පිළිබඳ සඳහන් වී ඇත.

16 හා 17 ප්‍රශ්න සඳහා,

16. පැරණි මූලාශ්‍රවල සඳහන් තොරතුරු හා සම්බන්ධ X හා Y තිර නිවැරදිව ගැලපූවිට ලැබෙන පිළිතුර තෝරන්න,

| X තීරුව | Y තීරුව |
|---|---|
| i.) ''වල්වල දඬුපත් නොපනු ඉසා'' | A - සද්ධර්මරත්නාවලිය |
| ii.) ''ලිය ජාතීහු කටු ඇති රුකය'' | B - පූජාවලිය |
| iii.) ''මාගේ දුවණියට කිරි කන්නට සරක් බානක් දුනමනාය'' | C - බුද්ධන්නේහෙල සෙල්ලිපිය |
| iv.) ''පිටදඬහස, මදහස, අකල හස'' | D - හෝපිටිගම ටැම්ලිපිය |
| | E - නෝනිගල සෙල්ලිපිය |

(1) E D C B ය. (2) A B C E ය. (3) C B D A ය. (4) C A B E ය.

17. පැරණි තාක්ෂණික අංග හා සම්බන්ධ X හා Y තීරුවේ තොරතුරු නිවැරදි ගැලපූවිට ලැබෙන පිළිතුර වන්නේ,

| X තීරුව | Y තීරුව |
|---|---|
| i.) සකපෝරුව | M - සමනල වැව |
| ii.) වජ්‍ර චුම්භට න්‍යාය | N - සීගිරිය |
| iii.) යකඩ නිස්සාරණ උදුන | O - උඩරංචාමඩම නිවස |
| iv.) ජලමල් තාක්ෂණය | P - දැදිගම |
| | Q - රුවන්වැලි සෑය |

(1) M P Q N ය. (2) O Q M N ය. (3) P Q O M ය. (4) M N O P ය.

18. මාතොට වරායට සමීපව ඉදිකර ඇති හින්දු කෝවිල කුමක් ද?
(1) රාමේෂ්වරම් ය. (2) කෝනේෂ්වර්ම් ය. (3) මුන්නේස්වරම් ය. (4) තිරුකේතිෂ්වරම් ය.

● පහත A සිට E දක්වා දී ඇති ප්‍රකාශ අතුරෙන් අංක 19 සිට 21 දක්වා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

A - යාපනයේ පියංගුකතිස්ස නමින් විහාරයක් ඉදිකිරීම.
B - චන්ද්‍රභානු පරාජයට පත් කිරීම
C - පොළොන්නරුව තම අගනගරය කර ගැනීම
D - කලිකාල සාහිත්‍ය සර්වඥ පණ්ඩිත යන නාමය යෙදීම
E - අයබදු එකතු කිරීම ක්‍රමවත් කල පාලකයා වීම
F - චෝලයන්ගෙන් රට නිදහස් කර ගැනීම

19. I වන විජයබාහු රජතුමා හා සම්බන්ධ නිවැරදි තොරතුරු දැක්වෙන ප්‍රකාශ යුගලය වන්නේ,
(1) A හා C ය. (2) B හා D ය. (3) C හා F ය. (4) C හා E ය.

20. වසභ රජතුමාගේ කාර්‍යය හා සම්බන්ධ නිවැරදි ප්‍රකාශ යුගලය වන්නේ,
(1) P හා Q ය. (2) A හා E ය. (3) D හා A ය. (4) E හා F ය.

21. II වන පරාක්‍රමබාහු රජතුමාගේ සේවාවන් දැක්වෙන පිළිතුරු යුගලය වන්නේ,
(1) D හා E ය. (2) E හා F ය. (3) B හා D ය. (4) C හා D ය.

22. ශ්‍රී ලංකාව අතීතයේ ''රතු කැට දිවයින'' නමින් හඳුන්වා ඇත්තේ කවුරුන් විසින් ද?
(1) සුලෙයිමාන් විසින් ය (2) රොබට නොක්ස් විසින්ය (3) අල්බල්සූරි විසින්ය (4) ඉබන් බතූතා විසින් ය.

23. ''කැති අඩ'' හා ''කෙටු කනබ'' අය යන නම්වලින් සෙල්ලිපිවල හඳුන්වා ඇත්තේ,
(1) වෙළදාම් කිරීමේ දී භාණ්ඩ සඳහා අයකල බදු ය.
(2) වී වගාකල කන්න දෙක ය.
(3) ජල පරිභෝජනය වෙනුවෙන් අයකල බදු ය.
(4) හේන් වගාවන් වලින් අයකල බදු ය.

● පහත වගුවේ සඳහන් තොරතුරු නිවැරදිව ගලපා 24, 25 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

| සටන පැවති ප්‍රදේශය | | රජු | | සටන | |
|---|---|---|---|---|---|
| A | සීතාවක | D | I විමලධර්මසූරිය රජු | I | 1562 - මුල්ලේරියා සටන |
| B | කෝට්ටේ | E | II රාජසිංහ රජු | J | 1638 - ගන්නෝරු සටන |
| C | කන්ද උඩරට | F | මායාදුන්නේ රජු | K | 1594 - දන්තුරේ සටන |

24. පෘතුගීසින්ට පෙරදිග දී ලද දරුණුතම පරාජය අත්කර දෙමින් සිදුකල සටන හා සම්බන්ධ තොරතුරු සංයෝගය දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) C, E හා J ය. (2) A, D හා K ය. (3) A, F හා I ය. (4) C, B හා K ය.

25. පෘතුගීසින් උඩරටට එල්ල කරන ලද අවසන් සටන පිළිබඳ තොරතුරු දැක්වෙන සංයොගය කුමක් ද?
(1) C, E හා J ය. (2) A, F හා I ය. (3) B, D හා J ය. (4) B, D හා K ය.

26. මහනුවර යුගයේ දී රාජ්‍ය පාලන සංවිධානය තුල අධිකාරම්වරුන්ගේ ආඥා හෝ පණිවිඩ ප්‍රාදේශීය නිලධාරින් කරා ගෙන ගිය පිරිස හඳුන්වනු ලැබුයේ,
(1) ලියන රාළ නමිනි. (2) උණ්ඩිය රාළ නමිනි.
(3) කටුපුල්ලේ නිලධාරි නමිනි. (4) කෝරාල නමිනි.

27. ගම්පල රාජ්‍ය සමයේ දී චෙන් හෝ සෙන්පතියා විසින් ගාල්ලේ පිහිටුවා ගිය ත්‍රී භාෂා සෙල්ලිපියේ සඳහන් භාෂා තුන නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) දෙමළ, උර්දු හා චීන භාෂාය. (2) චීන, පර්සියන් හා දෙමළ භාෂාය.
(3) දෙමල, සිංහල හා චීන භාෂාය. (4) චීන, ජපන් හා ලතින් භාෂාය.

28. ශ්‍රී ලංකාව අවසාන වරට එක්සේසත් කල රජතුමා කවු ද?
(1) ශ්‍රී වික්‍රම රාජසිංහ රජුය. (2) I වන විමලධර්මසූරිය රජුය.
(3) කීර්ති ශ්‍රී රාජසිංහ රජුය. (4) VI වන පරාක්‍රමබාහු රජුය.

29. ගම්පල යුගයට අයත් ගඩලාදෙණිය විහාරයේ ඇති පිළිමගෙහි ගෘහ නිර්මාණ ශිල්පය අයත් වන්නේ,
(1) දකුණු ඉන්දියානු ගෘහ නිර්මාණ ශෛලියටය. (2) පල්ලව ගෘහ නිර්මාණ ශෛලියටය.
(3) මෞර්ය සම්ප්‍රදායටය. (4) කාංචි ගෘහ නිර්මාණ ශෛලියටය.

30. I වන විමලධර්මසූරිය රජු හා කල සටනකින් පරාද වී පැමිණෙන විට පෙතංගොඩ උයනේ දී උණ කටුවක් ඇනීමෙන් ඇති වූ තුවාලයක් හේතුවෙන් මරණයට පත් රජතුමා වන්නේ,
(1) II වන රාජසිංහ රජුය. (2) I වන රාජසිංහ රජුය.
(3) I වන විමලධර්මසූරිය රජුය. (4) II වන විමලධර්මසූරිය රජුය.

- **පහත A, B, C හා D යන පද යුගල අධ්‍යයනය කර 31, 32, 33 හා 34 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

A - 1. මධ්‍යතන යුගයේ පල්ලි ආධිපත්‍ය
- 2. ආගමික ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය

B - 1. ජාතික රාජ්‍ය
- 2. දේශගවේශණය

C - 1. වැඩ වසම් ක්‍රමය
- 2. ප්‍රවේණි ක්‍රමය

D - 1. දේව වරම් වාදය
- 2. සණරන් වාදය

31. පලමු වැන්නේ බිඳ වැටීම මත දෙවැන්න ඇතිවීම දක්නට ලැබේ.
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

32. පලමුවැන්නේ බිහිවීම මත දෙවැන්න ඇතිවීමට පසුවිම සැකසුනි.
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

33. ඉහත සඳහන් තොරතුරු අතරින් කිසිඳු සබඳතාවයක් නොපෙන්වන අදහස් යුගලය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

34. පලමුවැන්න හා දෙවැන්න අතර සෘජු සබඳතාවයක් පෙන්වනු ලබන තොරතුරු සංයෝගය වන්නේ,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

35. නූතන තාරකා විද්‍යාවේ පියා ලෙස සලකන්නේ පහත සඳහන් විද්‍යාඥයන් අතරින් කවුරුන් ද?
(1) ජොහැන්නස් කෙප්ලර් ය. (2) ගැලීලියෝ ගැලීලි ය.
(3) නිකලස් කොපර්නිකස් ය. (4) ජොහැන්නස් ගුටෙන්බර්ග් ය.

36. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යන්ගේ යටත් විජිතයක්ව පැවති කාල සීමාව නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ක්‍රි.ව. 1795 සිට ක්‍රි.ව. 1948 දක්වාය. (2) ක්‍රි.ව. 1815 සිට ක්‍රි.ව. 1948 දක්වාය.
(3) ක්‍රි.ව. 1803 සිට ක්‍රි.ව. 1948 දක්වාය. (4) ක්‍රි.ව. 1815 සිට ක්‍රි.ව. 1972 දක්වාය.

37. ''ක්‍රිස්තියානින් හා කුළුබඩු සොයා අපි මෙහි පැමිණියෙමු'' යන ප්‍රකාශය කල පෘතුගීසි ජාතිකයා වන්නේ,
(1) ලොරෙන්සෝ ද අල්මේදා ය. (2) ෆැරැන්සිස්කෝ ද අල්මේදා ය.
(3) වස්කෝද ගාමා ය. (4) බර්තෝලමියුදියෙස් ය.

**● පහත Q සිට V දක්වා දී ඇති තොතුරු අධ්‍යනය කර අංක 38 සිට 39 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

Q - සපුමල් කුමරු යාපනයට යවා සටන් කොට යාපනය රාජ්‍ය කෝට්ටේට ඈදා ගැනීම.
R - උඩරට සාමාත්ත පාලකයා වූ ජෝතිය සිටුවරයා ඇතිකල කැරැල්ල මැඩලීම.
S - සියම් නිකායේ ආරම්භය සිදුවීම.
T - රහස් උමගයක් මගින් පැලැඳ ප්‍රදේශයට පලාගොස් පෘතුගීසි විරෝධි සටනක් ඇරඹීම.
U - වැලිවිට සරණංකර හිමි ට සංඝරාජ පදවියක් පිරිනැමීම.
V - යාපන ප්‍රදේශයේ දී උණ රෝගයක් සෑදී මරණයට පත්වීම.

38. ඉහත තොරතුරු ඇසුරින් කෝට්ටේ රාජධානි සමයේ දී මෙරට සිටි පුද්ගලයෙකුට වීදිය බණ්ඩාර සම්බන්ධයෙන් අසන්නට ලැබෙන තොරතුරු මොනවා ද?
(1) P හා S ය. (2) S හා T ය. (3) Q හා S ය. (4) T හා V ය.

39. කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමාගේ සේවාවන් පිළිබඳ තොරතුරු සඳහන් සංයෝගය කුමක් ද?
(1) S හා U ය. (2) T හා U ය. (3) Q හා S ය. (4) R හා S ය.

40. නිරිත දිග යුරෝපයේ අයිබීරියන් අර්ධද්වීපයට අයත් රටවල් දෙක නිවැරදිව දැක්වෙන පිළිතුර වන්නේ,
(1) ස්පාඤ්ඤය හා ප්‍රංශයයි. (2) පෘතුගාලය හා ප්‍රංශයයි.
(3) ස්පඤ්ඤය හා පෘතුගාලයයි. (4) ඕලන්දය හා බෙල්ජියමය.

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade - 10 ශ්‍රේණිය | ඉතිහාසය - II | කාලය / நேரம் / Time - පැය 03 යි විනාඩි 10 යි. |

නම / பெயர் / Name ..............................................................  විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ......................................

- සැලකිය යුතුයි
  - I කොටසේ 1 වන ප්‍රශ්ණය අනිවාර්යය වේ.
  - II වන කොටසින් ප්‍රශ්න හතරකටද iii වන කොටසින් ප්‍රශ්න එකකට ද පිළිතුරු සපයන්න.
  - පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන හයකි.

## I කොටස

01. (අ) පහත i යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලංකා සිතියමේද ii යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසේ ද ලකුණු කර නම් කරන්න.

(i) දඹකොල පටුන, මිහිතලේකන්ද, සීගිරිය, කෝනේෂ්වරම් කෝවිල, වලවේ ගඟ, කෝට්ටේ, පරාක්‍රම සමුද්‍රය, ගන්නෝරුව, ගල් ඔය, මහා තිත්ථ, මහියංගනය, අනුරාධපුරය. (ලකුණු 12)

(ii) පෘතුගාලය, ලන්ඩන්, රතු මුහුද, කොන්ස්තන්තිනෝපලය, ජාවා දූපත, ජපන් දූපත්. (ලකුණු 06)

(ආ) පහත A, B, C හා D යටතේ දක්වා ඇති ප්‍රශ්න සඳහා අදාල පිළිතුරු අනුපිළිවෙලින් ලියන්න.

(i) මෙරට පාලනය කල ප්‍රථම රජතුමා -
(ii) මෙරට පාලනය කල අවසාන සිංහල රජතුමා -
(iii) ආගමික ප්‍රතිසංස්කරන ව්‍යාපාරයේ නායකයා -
(iv) මුද්‍රණ යන්ත්‍රය ලොවට හඳුන්වා දුන් පුද්ගලයා - (ලකුණු 04)

(ඇ) දී ඇති පිංතූර අධ්‍යනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



(i) මෙම පිංතූරයෙන් දක්වා ඇත්තේ කුමක් ද?

(ii) මෙය ලැබී ඇත්තේ කොහෙන් ද?

(iii) මෙය නිර්මාණය කර ඇති ලෝහ වර්ගය නම් කරන්න.

(iv) මෙහි ඇති විද්‍යාත්මක මූල ධර්මය කුමක් ද? (ලකුණු 04)

(ඉ)



(i) මෙම පිංතූරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

(ii) මෙම සිතුවම අඳින ලද්දේ කවුරුන් විසින් ද?

(iii) මෙය ඇඳ ඇත්තේ කොහේ ද?

(iv) මෙම සිතුවම කුමන යුගයකට අයත් ද? (ලකුණු 04)

## II කොටස

02. (i) මහාවංශය හා දීපවංශය වැනි පැරණිතම මූලාශ්‍ර රචනා කිරීමේ දී පාදක කර ගන්නා ලද පැරණිතම මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ලකුණු 03)

(ii) සාහිත්‍ය මූලාශ්‍රයක් පරිශීලනය කිරීමේ දී සලකා බැලිය යුතු සාධක දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පහත සඳහන් මාධ්‍ය මත ලියා ඇති අභිලේඛන මූලාශ්‍ර සඳහා උදාහරණය බැගින් ලියන්න.

i.) ශිලාඃ- ..............................

ii.) තඹ තහඩුඃ- ..............................

iii.) බිත්තිඃ- ..............................

iv.) රන් තහඩුඃ- ..............................

iv.) ලීඃ- ..............................

(ලකුණු 05)

(iv) නානක මූලාශ්‍ර මගින් ඉතිහාසය ඉගෙනීම සඳහා ලබාගත හැකි ප්‍රයෝජන තුනක් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

03. (i) ප්‍රාග් ඓතිහාසික යුගයේ මානවයා සම්බන්ධයෙන් පහත අසා ඇති ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර ඉදිරියෙන් ලියන්න.

a) - ශ්‍රී ලංකාව ජනාවාස කල මුල්ම මානවයා -

b) - ප්‍රාග් ඓතිහාසික ජනාවාස පිහිටවා ගත් ප්‍රධාන පරිසර කලාප ගණන -

c) - ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්තිය සම්බන්ධ ප්‍රධාන භූ. අවධිය -

(ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා ජනාවාස පිහිටවා ගැනීමේ දී සලකා බැලූ සාධක දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානවයාගේ අභිචාර ක්‍රම පිළිබඳව උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යාප්තිය හා ව්‍යුහාත්මක ස්වරූපය උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

04. (i) පහත සඳහන් විද්‍යාත්මක න්‍යායන් භාවිත කල අවස්ථා සඳහා උදාහරණ වරහන තුලින් තෝරා ඉදිරියෙන් ලියන්න.

a) - පීඩන ශල්කන න්‍යාය -

b) - වජ්‍ර චුම්භට න්‍යාය -

c) - ලම්භක න්‍යාය -

(වැව් බැම්ම, උඩරංචාමඩම නිවස, සීගිරි ජලමල්, රුවන් මැලි සෑය, ශුද්‍ර ගල් මෙවලම්, මැටි වලං)

(ලකුණු 03)

(ii) පහත සඳහන් සඳහන් වාරි තාක්ෂණික අංග මගින් ඉටුවන කාර්යයන් එක බැගින් ඉදිරියෙන් ලියන්න.

a) - කුළුවැව -

b) - පිටවාන -

c) - බිසෝ කොටුව -

d) - රළ පනාව -

(ලකුණු 04)

(iii) පැරණි නගර නිර්මාණයේ දී අලංකරණය හා ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් වූ ආකාරය සීගිරිය ඇසුරින් උදාහරණ දෙකක් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 05)

(iv) වසභ රජුගේ වැදගත්කම උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

05. (i) පහත සඳහන් වෘත්තීන් අතීතයේ දී හඳුන්වන ලද නම් ඉදිරියෙන් ලියන්න.

1.) - දණ්ඩනායක -

2.) - චිතකර -

3.) - තන්තුවාය - (ලකුණු 03)

(ii) ඓතිහාසික යුගයේ ජනයාගේ ආහාර රටාව තුල ප්‍රභූ ජනයාගේ ආහාර හා දුගී ජනයාගේ ආහාර පිළිබඳ දිය හැකි උදාහරණ දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) පැරණි ලාංකීය කාන්තාව ජීවිතයේ විවිධ අවස්ථාවල විවිධ වූ භූමිකා නියෝජනය කල බව උදාහරණ දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අතීතයේ මෙරට විධිමත් අභ්‍යන්තර වෙළඳාමක් පැවති බව උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

06. (i) අතීතයේ මෙරට පාලනය මෙහෙයවන ලද ප්‍රධාන ආයතන තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) මහජනයාගේ සනීපාරක්ෂාව හා ස්වස්ථතාවය පිළිබඳව පැරණි රජවරුන් කටයුතු කල ආකාරය පිළිබඳව තොරතුරු පහත දක්වා ඇත. එම ක්‍රියාවන් හා සම්බන්ධ රජවරු කවුරුන්දැයි වරහනින් තෝරා ඉදිරියෙන් ලියන්න.

1.) - උණ රෝගය වැලදුනු අය වෙනුවෙන් ''උපසග්ග රෝග නාස'' නමින් රෝහල් ඉදිකිරීම. -

2.) - ගැබිනි මව්වරුන්ගේ අවශ්‍යතාවය සඳහා මාතෘ නිවාස ඉදිකිරීම. -

3.) - සොත්ථිශාලා ඉදිකිරීම. -

4.) - සෞඛ්‍ය පහසුකම් ලබා දීම සඳහා රෝහල් 18 ක් ඉදිකිරීම. -

(පණ්ඩුකාභය රජු, V වන මහින්ද, IV වන කාශ්‍යප රජු, I වන උපතිස්ස රජු / දුටුගැමුණු රජු) (ලකුණු 04)

(iii) II වන පරාක්‍රමබාහු රජුගේ සේවාවන් දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) පැරණි නගර පරිහාණිය හෙවත් පොළොන්නරු රාජධානිය බිඳ වැටීමට බලපෑ හේතු තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06)

07. (i) මහනුවර රාජධානිය හඳුන්වන ලද වෙනත් නම් තුනක් ලියන්න. (ලකුණු 03)

(ii) මහනුවර රාජධාණියේ ආර්ථික කටයුතු වල දක්නට ලැබුණු විශේෂ ලක්ෂණ හතරක් ලියන්න. (ලකුණු 04)

(iii) උඩරට සමාජ සංවිධානය සැකසී තිබුණු ආකාරය උදාහරණ දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.(ලකුණු 05)

(iv) ''I වන විමලධර්මසූරිය රජු උඩරට නව රාජ පරම්පරාවක් ආරම්භ කරමින් දේශපාලන ස්ථාවරත්වය ගොඩ නගනු ලැබුයේ අභියෝග රැසකට මුහුණ දෙමින් හා ඒවා උපක්‍රමශීලිව ජයග්‍රහණය කරා ගෙන යමිනි.'' රජු එම අභියෝග ජයගත් ආකාරය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

## III කොටස

08. (i) ''පුනරුදය'' යනුවෙන් හඳුන්වන්නේ කුමක්දැයි නිර්වචනය කරන්න. (ලකුණු 03)

(ii) පුනරුදය ඇතිවීම කෙරෙහි බලපෑ හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) යුරෝපයේ පුනරුදය ඇසුරින්, දේව වරම් වාදය හා මානව වාදය පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) ගෝලීය ප්‍රවණතාවයක් ලෙස යුරෝපයේ පුනරුදය ලංකාව කෙරෙහි බලපෑ ආකාරය උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

09. (i) අතීතයේ ආසියාව හා යුරෝපය අතර පැවති සබඳතා ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a) පෘතුගීසීන්ගේ මව් රාජ්‍ය -

b) මධ්‍යතන යුගය වන විට ආසියාවේ වෙළඳ බලය තහවුරු කරගෙන සිටි ජාතිය -

c) පෘතුගාලයේ නාවුක විද්‍යාලයක් පවත්වාගෙන ගිය පාලකයා - (ලකුණු 03)

(ii) දේශගවේෂණය සඳහා යුරෝපා ජාතීන් පෙළඹවීමට බලපෑහේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(iii) යුරෝපා ජාතිකයන් වුවත් ලන්දේසීන් උඩරට රාජ්‍ය සමග සබඳතා පැවැත්වීමේ දී ඔවුන්ගේ දේශපාලන ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iv) දේශගවේෂණය නිසා ලෝකයේ ඇති වූ දේශපාලන හා ආර්ථික ප්‍රතිඵල එක බැගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

Grade - 10

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)
Final Term Test - 2023 (2024)

33 | S | II

# ඉතිහාසය, வரலாறு, History - II


විභාග අංකය / சுட்டெண் / Index No. ..............................

(i)




අනෙක් පිටුව බලන්න/ மறுபக்கம் பார்க்க/ See next page

(ii)




LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න